සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

**තෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2023**
**Third Term Test - Grade 08 - 2023**

## සිංහල භාෂාව හා සාහිත්‍යය

**කාලය පැය 02 යි**

නම / විභාග අංකය:

### I - කොටස

සැලකිය යුතුයි.

- ප්‍රශ්න සියල්ලට ම මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න.
- වඩාත් සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

---

අංක 1 සහ 2 ප්‍රශ්නවල ඉරි ඇඳි පදයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන පිළිතුර තෝරන්න.

01. අනුන්ගේ දියුණුවට <u>අකුල් හෙළීම</u> නොකළ යුතු බව ගුරුතුමා පැවසුවේ ය.
    i. නින්දා කිරීම    ii. බාධා කිරීම    iii. දඬුවම් කිරීම    iv. ඊර්ෂ්‍යා කිරීම

02. තමා කළ සොරකමක් හෙළිවීම නිසා ජිනදාසට <u>හීන් දාඩිය</u> දැම්මේ ය.
    i. වෙහෙසක් ඇති විය.    ii. බියක් ඇතිවිය.    iii. ලජ්ජාවක් ඇති විය.    iv. කෝපයක් ඇති විය.

03. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පිළිතුර තෝරන්න.
    i. නවීකරනය - නිෂ්පාදනය    ii. සීඝ්‍රගාමී - නිර්මානය
    iii. මර්ධනය - ප්‍රදර්ශණය    iv. නිරීක්ෂණය - විශිෂ්ට

04. මහාප්‍රාණ අක්ෂර දෙකක් ඇති පිළිතුර තෝරන්න.
    i. භාණ්ඩාගාරය    ii. අධිෂ්ඨානය    iii. ඝර්ෂණය    iv. නිෂ්ඵල

05. සඤ්ඤක අක්ෂර යෙදී ඇති වචන යුගලය තෝරන්න.
    i. නුවණ - පහළ    ii. ඥාණය - දඟයා    iii. තඹර - කරඬුව    iv. සංයුතිය - පරිමාව

06. මුල් පදයට විරුද්ධ අර්ථයක් ඇති යුගල පදය වන්නේ,
    i. චාරිත්‍ර - වාරිත්‍ර    ii. වත ගොත    iii. සැප සනීප    iv. කුඩ බුඩ

07. ඉදිරියේ ඇති පදයට සමාන පදයක් යෙදී නොමැති පිළිතුර තෝරන්න.
    i. අනවරත - නිරන්තර, නිතර    ii. ඕලු - ශාලුක, පියුම්
    iii. කෝකිල - කොවුල්, පරපුටු    iv. පොළොව - ධරණී, මහී

08. ඉදිරියේ ඇති පදයට විරුද්ධාර්ථය දෙන පද පේළිය තෝරන්න.
    i. වාසනාව - භාගය, අභාග්‍ය    ii. මෘදු - සියුමැලි, සිනිඳු
    iii. කුසල් - පව්, අකුසල්    iv. පිරුණු - බහුල, නොමද

09. අකාරාදි පිළිවෙළ නිවැරදි ව යොදා ඇති පද පේළිය වන්නේ,
    i. පතල, බතල, මහත, යහන    ii. වතුර, කතුර, පතුර, මිතුර
    iii. නයන, මවන, කලණ, සයන    iv. ටයරය, දබරය, කවරය, වයරය

10. බියට පත් රියදුරා <u>වේගයෙන්</u> රිය පැදෙව්වේ ය. මෙහි ඉරිගසා ඇති පදය
   i. නාම විශේෂණයකි. ii. පූර්ව ක්‍රියාවකි. iii. මිශ්‍ර ක්‍රියාවකි. iv. ක්‍රියා විශේෂණයකි.

11. උපසර්ග පද පමණක් යෙදුණු පද පේළිය වන්නේ,
   i. අකුසල්, දුදන, අගුණ, නිවරද ii. කෙලෙස්, මිනිස්, නොහොඳ, නුගුණ
   iii. අවට, අහස, පහළ, කමල iv. නොමැති, පිනැති, දුවති, සිතති

12. ''මනා සේ රැක ගැනීම'' යන්නෙහි තනි පදය වන්නේ,
   i. රක්ෂණය ii. සංරක්ෂණය iii. ආරක්ෂාව iv. සුපරික්ෂාව

13. නිවැරදිව පද බෙදා ලියා ඇති සංඛ්‍යාවාචී පද සහිත පිළිතුර වන්නේ,
   i. 48ක්, 25 කින්, 100ට ii. 25ක්, 100ට, 50කින්
   iii. 35 ක්, 25 කින්, 50 කට iv. 48ක්, 25ට, 100 කින්

14. තිත් තුන (. . .) යෙදීමෙන් අදහස් වන්නේ,
   i. යම්කිසි උද්ධෘත පාඨයක මුලින් කොටසක් අත්හළ බව
   ii. යම්කිසි උද්ධෘත පාඨයක මැදින් කොටසක් අත්හළ බව
   iii. යම්කිසි උද්ධෘත පාඨයක මුලින්, මැදින් හෝ අගින් කොටසක් අත්හළ බව
   iv. යම්කිසි උද්ධෘත පාඨයක අගින් කොටසක් අත්හළ බව

15. ගිහි කල ලද්දූ මිගෙල් මැන්දිස් යනුවෙන් හැඳින්වූයේ,
   i. වාරියපොල සුමංගල හිමි ii. කුඩාපොල හිමි
   iii. ඇස්. මහින්ද හිමි iv. මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි

16. පහත වාක්‍ය අතරින් නිවැරදි වාක්‍යය තෝරන්න.
   i. ඔවුන් තරගයෙන් ජය ලබති. ii. ඔහු ප්‍රදර්ශනය නැරඹුවේ ය.
   iii. හෙතෙම ප්‍රදර්ශනය නැරඹුවෙ හු. iv. නුඹලා ප්‍රදර්ශනය නැරඹුවෙ හි.

17. 'මම ගමට යමි' යන වාක්‍යයේ අතීත කාල වාක්‍යය වන්නේ,
   i. මා ගමට ගියෙමි. ii. මා ගමට ගියෙහි.
   iii. මම ගමට ගියෙමි. iv. මම ගමට ගියෙහි.

18. 'කොටියා <u>මුවන්</u> මරයි' යන වාක්‍යයේ ''මුවන්'' යන පදය
   i. උක්ත කර්තෘය. ii. උක්ත කර්මය. iii. අනුක්ත උක්තය. iv. අනුක්ත කර්මය.

19. නිවැරදි වාක්‍යය තෝරන්න.
   i. කුසුම්හු සුවඳ දී පිපෙයි. ii. අරුණෝදයේ පද්මයෝ පිබිදෙයි.
   iii. තාත්තා සෙනෙහසින් අප රැක ගත්තෝ ය. iv. ගුවන අරා පුරා හඳ දිලිසුණේ ය.

20. පහත ඇති වාක්‍ය අතරින් ව්‍යාකරණානුකූලව වැරදි වාක්‍යය තෝරන්න,
   i. සියලු සතුරෝ මිතුරෝ වෙත්වා ! ii. අපි සුවපත් වේවා !
   iii. දරුවෝ යහපතෙහි හැසිරෙත්වා ! iv. සියලු සත්ත්වයෝ නිදුක් වෙත්වා !

(ලකුණු 2 × 20 = 40)

## II - කොටස

- පළමු, දෙවන හා තෙවන ප්‍රශ්න අනිවාර්ය වේ. තවත් ප්‍රශ්න දෙකක් තෝරා ගෙන සම්පූර්ණ ප්‍රශ්න 05 කට පිළිතුරු ලියන්න.

---

(01) පහත ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු ලියන්න.

1. පහත දැක්වෙන වාක්‍යයේ ඉරි ඇඳ ඇති පද දෙක පමණක් නිවැරදි කර ලියන්න.

   අප විදුහලේ ත්‍යාග <u>ප්‍රධානෝත්සවයට</u> පැමිණි ප්‍රධාන අමුත්තා <u>විෂේශ</u> ආසනයක වාඩි කරවූයේ විදුහල්පති තුමාය.

2. පහත ප්‍රශ්වල දී ඇති අදහසට ගැළපෙන රූඪිය ලියන්න.

   (අ) බොරු සීලයක් පෙන්වීම. (ආ) ස්වල්ප වේලාවක නින්ද

3. පහත දී ඇති පදවලට යෙදිය හැකි බහ්වර්ථ පද දෙක බැගින් ලියන්න.

   (අ) දිය -

   (ආ) පිය -

4. එක් එක් කවි පදයේ ඉරි ඇඳ ඇති පදය අයත් ක්‍රියා වර්ගය ලියන්න.

   (අ) කැලේ තිබෙන කොයි දේ වත් <u>රසවේවා</u>

   (ආ) <u>බලව්</u> පොළොන්නරු අනුරාපුර පෙදෙස

5. තනි පද ලියන්න.

   (අ) ලීයෙන් තැනූ -

   (ආ) දිය ගොඩ දෙකෙහි ම වසන -

(ලකුණු 10)

(02) පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන 150 ට නොඅඩු රචනාවක් ලියන්න.

1. අනගාරික ධර්මපාලතුමා
2. වස විසෙන් තොර දේශීය ආහාර පරිභෝජනය කිරීමේ වැදගත්කම
3. විදුලිය අරපිරිමැස්මෙන් භාවිත කරමු
4. මුළු අහස ම දම්පාට ය. වට පිටාව තද කළුවර වෙලා ගෙන ය. ගස්වැල් අඹරවමින් මහ සුළඟක් හමා එයි. මිනිස්සු කඩිමුඩියේ පාර දිගේ යන අයුරු පෙනෙයි. පුංචි නංගී වඩාගත් නයනා ඉස්තෝප්පුවට වී පාර දෙස විපරමින් බලයි. පොළට ගිය අම්මා තවම නැත. ... ඇගේ සිත බියෙන් සසල වෙයි.

   මෙම තොරතුරු ඇසුරෙන් ඔබේ හිතට දැනෙන හැඟීම් ඇතුළත් කරමින් කතාව ඉදිරියට ගොඩනගන්න.

(ලකුණු 20)

(03) පහත කොටස් දෙකින් එකකට පිළිතුරු ලියන්න.

ඔබ ගමේ ළමා සමාජයේ ලේකම් යැයි සිතන්න.

''ළමා අපයෝජන පිටුදකිමු.'' යන මාතෘකාව යටතේ දේශනයක් කිරීම සඳහා ප්‍රදේශයේ පොලිස් ස්ථානාධිපතිතුමාට ආරාධනා කරන රාජකාරි ලිපිය ලියන්න. සම්මත ආකෘතිය හෝ පරිගණක ආකෘතිය යන ආකෘති දෙකෙන් ඔබ කැමති ආකෘතියක් තෝරා ගන්න.

නැතහොත්

දේශීය ආහාර පරිභෝජනයේ වැදගත්කම පිළිබඳව දැනුවත් කිරීමට සුදුසු දැන්වීම් පත්‍රිකාවක් සකස් කරන්න.

(ලකුණු 10)

(04) පහත ප්‍රකාශ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

(අ) ''මං හිතුවා කීරාලලාගේ දිහා පැළ වුණා කියලා.''

(i) මෙම කොටස ඇතුළත් නාට්‍යය කුමක්ද?

(ii) මෙම ප්‍රකාශය කළේ කවුද?

(ආ) ''බළලෙකු ඉතිං මට
අහුවුණහොතින් විගසට
කඩා උඟු දෙකක ට
දමමි ඇදලා කසළ ගොඩකට''

(i) මෙසේ කියන්නේ කවුද?

(ii) මේ කවිය ඇතුළත් ග්‍රන්ථය කුමක්ද?

(ඇ) ''මම මේ තරම් සේවාවක් කළේ මගේ නම තැන තැන අටවා ගන්න නොවෙයි.''

(i) මෙම ප්‍රකාශය කළේ කවුද?

(ii) මෙම ප්‍රකාශය කිරීමට හේතුව කුමක් ද?

(ඈ) ''කෝ.... කජු මල්ල...? කෝ...? උඹලා නැති කරලා.''

(i) මෙම ප්‍රකාශය කළේ කවුද?

(ii) මෙම ප්‍රකාශය අයත් පාඩම කුමක් ද?

(ඉ) ''හෙට හවස මාත් එක්ක කැකිරාවට යන්න ලෑස්ති වෙලා එන්න පුළුවන්ද?''

(i) මෙම ප්‍රකාශය කළේ කවුද?

(ii) මෙම ප්‍රකාශය අයත් කෙටිකතාව කුමක් ද?

(ලකුණු 2 × 5 = 10)

(05) පහත කවිය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

කරන කලට පව් මීරිය මීසේ
විඳින කලට දුක් දැඩි වෙයි ගිනි සේ
ඇඳින එපව් දුරලන උපදේසේ
නුදුන මැනවි තුන්දොර අවකාසේ

1. මෙම කවිය ඇතුළත් කාව්‍ය සංග්‍රහය කුමක් ද?
2. මෙම කාව්‍ය සංග්‍රහයේ කතුවරයා කවුද?
3. මෙහි ඇතුළත් උපමා දෙකක් ලියන්න.
4. මෙයින් ලබා දෙන උපදේශය කුමක් ද?
5. මෙහි ඇතුළත් විධික්‍රියා පදයක් ලියන්න. (ලකුණු 2 × 5 = 10)

(06) පහත දී ඇති වාක්‍යවල හිස්තැනට සුදුසු උක්ත පදය හෝ ආඛ්‍යාත පදය වරහනෙන් තෝරා වාක්‍ය සම්පූර්ණ කරන්න.

1. ඔවුහු ............................ දුටුවෝය. (අප / අපි)
2. ..................................මිතුරන් දැකීමට ප්‍රිය කරමි. (මා / මම)
3. බැතිමත්හු දෙවියන් ............................ (පුදයි / පුදති)
4. ......................... දිය සොයා වැවට පැමිණියේ ය. (මුවෙකු / මුවෙක්)
5. ................................. ගමට ගියෙහු. (තොප / තොපි)
6. ශිෂ්‍යයා ගීයක් ............................ (ගයති / ගයන්නේය)
7. ගුවන්යානා ගුවන් තොටුපොළට .......................... (ළඟාවෙයි / ළඟාවෙති)
8. ............................... දහම් දෙසති (නාහිමියන් / නාහිමියෝ)
9. සරුංගල් අහසේ ........................... (පාවෙයි / පාවෙති)
10. මම නිදුක් ........................... (වේවා / වෙම්වා) (ලකුණු 10)